# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2361/06 - 2023 දෙසැම්බර් මස 04 වැනි සඳුදා - 2023.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. -21/78 (XV) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය, ආචාර්ය සුරේන් රාඝවන් වන මා විසින්, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් වශයෙන් සලකනු ලබන ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් (2023 පෙබරවාරි මස 13 වන දින අංක 2319/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2006 ජුනි මස 09 වන දින අංක 1448/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "දේශීය වෛද්‍ය විද්‍යා පීඨය" යන වචන වෙනුවට "දේශීය වෛද්‍ය පීඨය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "6. මෞලික සිද්ධාන්ත සහ ශරීර විඥාන අධ්‍යයන අංශය (මූලික මූලධර්ම, ආයුර්වේද ව්‍යුහවිද්‍යාව සහ කායික විද්‍යා අධ්‍යයන අංශය.)" යන අයිතමය වෙනුවට "6. මෞලික සිද්ධාන්ත සහ ශරීර විඥාන අධ්‍යයන අංශය (මූලික මූලධර්ම, ආයුර්වේද ව්‍යුහවිද්‍යාව සහ කායික විද්‍යා අධ්‍යයන අංශය)" යන අයිතමය ආදේශ කිරීමෙන්.

ආචාර්ය සුරේන් රාඝවන්,
උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0042


1A - PG 6547 — 457 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*